# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2108/59 – 2019 ජනවාරි 31 වැනි බ්‍රහස්පතින්දා – 2019.01.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුරුවිට කෝරළේ දකුණ උඩ පත්තුව සුළු කොට්ඨාසයේ, මැදගම (අ.ග.පි. 351) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක ආර්/ආර්ටීඑන්/2017/372 හා 2018.05.14 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 3.5525 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:

01. **කැබලි අක්ෂර 'ඒ' – බෙරි-ෆෙරස් වත්ත හෙවත් බෙරි ෆරස්ට් වත්ත – ප්‍රමාණය: හෙක්. 3.5525 ක් පමණ**

උතුරට: ඇඹිලිපිටිය වතු සමාගම හිමිකම් කියන බෙරි-ෆෙරස් වත්ත හෙවත් බෙරිෆරස්ට් වත්ත, සිරිසේන හේරත් හිමිකම් කියන බෙරි-ෆෙරස් වත්ත හෙවත් බෙරිෆරස්ට් වත්ත සහ ඩී. ඩබලිව්. කුසුමාවතී භුක්ති විඳින නිව් මල්වලවත්ත; නැගෙනහිරට: සිරිසේන හේරත් හිමිකම් කියන බෙරි-ෆෙරස් වත්ත හෙවත් බෙරිෆරස්ට් වත්ත, ඩී. ඩබලිව්. කුසුමාවතී සහ අයි. එම්. නිමල් තිලකසිරි භුක්ති විඳින නිව් මල්වලවත්ත සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි බෙරි-ෆෙරස් වත්ත හෙවත් බෙරිෆරස්ට් වත්ත; දකුණට: ඩී. ඩබලිව්. කුසුමාවතී සහ අයි. එම්. නිමල් තිලකසිරි භුක්ති විඳින නිව් මල්වලවත්ත, හිමිකම් කියන අය සොයාගත නොහැකි බෙරි-ෆෙරස් වත්ත හෙවත් බෙරිෆරස්ට් වත්ත සහ ඇඹිලිපිටිය වතු සමාගම හිමිකම් කියන බෙරි-ෆෙරස් වත්ත හෙවත් බෙරිෆරස්ට් වත්ත; බටහිරට: හිමිකම් කියන අය සොයාගත නොහැකි බෙරි-ෆෙරස් වත්ත හෙවත් බෙරිෆරස්ට් වත්ත සහ ඇඹිලිපිටිය වතු සමාගම හිමිකම් කියන බෙරි-ෆෙරස් වත්ත හෙවත් බෙරිෆරස්ට් වත්ත.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/15/2016/වීඊ/526.
2018 සැප්තැම්බර් මස 19 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

02 – 544

1A – G 29387 – 16 (2019/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*